# ශ්‍රී ලංකාවේ 6-11 වසර සඳහා කලාපීය ගණිත ගුරු උපදේශක භූමිකාව පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනය


ධවල පුෂ්පා අතුකෝරාළ
අධ්‍යාපනවේදී උපාධි
දෙවන පෙළ (ඉහළ සාමාර්ථ)


කොළඹ විශ්වවිද්‍යාලයේ
අධ්‍යාපන පීඨයේ,
1995 වසර දර්ශනපති උපාධිය
සඳහා ඉදිරිපත් කරන පර්යේෂණ කෘතියකි.

1998.


UCLIB
468561

## සංක්ෂේපය

පාසල් විෂය මාලාවෙන් වැදගත් විෂයයක් වන ගණිතයෙන් මිනිසාට නිරවුල්ව හා තර්කානුකූලව යමක් ඇති සැටියෙන් දැකීමට හැකි වේ.

ගණිත විෂයය දියුණු කිරීම සඳහා විෂයමාලාව වෙනස් කිරීම ප්‍රතිසංස්කරණය කිරීම, ගණිත ගුරුවරුන් පත් කිරීම, පුහුණු කිරීම හා ගුරු උපදේශකවරුන් පත් කිරීම වැනි ක්‍රියා මාර්ග අනුගමනය කර ඇති නමුත් රජයේ පොදු විභාග ප්‍රතිඵල සංසන්දනය කිරීමේ දී ගණිත විෂයයෙන් අසමත් වන්නන්ගේ දළ සංඛ්‍යාව 80% ක් පමණ වන බව පෙනී යයි.

මෙයට විසඳුමක් ලෙස ගණිත විෂයය ඉගෙනීම, හා ඉගැන්වීම කෙරෙහි නව ශිල්පීය ක්‍රම භාවිතයට ගත යුතුවේ. ඒ සඳහා ගණිත ගුරුවරුන්ට හා ශිෂ්‍යයින්ට මඟ පෙන්වීම කරනු ලබන ගණිත ගුරු උපදේශකවරයාගේ කාර්ය භාරය සෙවීම වැදගත් වන හෙයින් එම භූමිකාව පිළිබඳ කරන ලද අධ්‍යයනයක් ලෙස මෙම පර්යේෂණය හැඳින්වීමට හැකිය.

ගණිත ගුරු උපදේශක භූමිකාවේ දී මතු වී ඇති ගැටළු හඳුනා ගැනීම හා විෂය සංවර්ධනය සඳහා ඒවා කෙසේ සකස් කර ගත යුතුද? යන්න සලකා බැලීම පර්යේෂණයෙහි මූලික පරමාර්ථ වේ.

මේ සඳහා තෝරා ගත් දිස්ත්‍රික්ක තුනක කොට්ඨාශ කාර්යාලයන් විස්සක ගණිත ගුරු උපදේශකවරුන් තිහකගෙන් ද 1 ඒබී, 2 හා 1සී වර්ගයේ පාසල් තිහක ගණිත ගුරුවරුන් අනු දෙදෙනෙකුගෙන් ද

විදුහල්පතිවරුන්, අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ගණිත ව්‍යාපෘති නිලධාරීන් හා විෂය විශේෂඥයින් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වීමෙන් ද ගණිත ගුරුවරුන් තිහකගේ ඉගැන්වීම් රටාව නිරීක්ෂණය කිරීම හා ප්‍රකාශිත ලිපි ලේඛණ මඟින් ලබාගත් දත්ත අනුව මෙම පර්යේෂණය මෙහෙය වීය.

තොරතුරු විශ්ලේෂණය කිරීමේදී මෙම භූමිකාව කලාපීය පාසල් සඳහා ස්ථාපිත වී ඇතත්, ගණිත ගුරු උපදේශකවරයා විසින් ඉටු කළ යුතු කාර්යයන් නිශ්චිත හා පැහැදිලිව සඳහන් වී නොමැති නිසා ක්‍රියාත්මක වීමේ දී විෂමතා රාශියක් පවතින බව පෙනී යයි. මෙහි ක්‍රියාකාරීත්වයට බාධා පමුණුවන ප්‍රධාන කරුණු ලෙස පත්වීමේ ඇති අනියම් භාවයන් වගකීම් හා යුතුකම් නිසි පරිදි නොපැවරීමත්, දිරිදීමනා වරප්‍රසාද නිසිලෙස නොලැබීමත් පිළිගත් ශ්‍රේණියක් හා සේවාව ඇගැයීමකට භාජනය නොකිරීමත් පෙන්නුම් කළ හැකිය.

මෙම භූමිකාවේ සාර්ථක ක්‍රියාකාරීත්වයට ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කළ යුතු අතර පැහැදිලි නායකත්වයකින් යුක්තව නවීකරණයට යොමු වූ නිරන්තර දැනුම ලබා ගැනීමට හැකි ආකාරයට මඟ පෙන්වීම තුළින් සේවාව ප්‍රතිසංවිධානය විය යුතු බව අධ්‍යයනයෙන් පෙනී යයි.